---

**වැලිගම ප්‍රාදේශීය සභාව**

**මාතර දිස්ත්‍රික්කය**

---

1. මූල්‍ය පකාශන

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2013 මාර්තු 29 දිනද, ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2012 අප්‍රේල් 11 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපති වාර්තාව 2013 නොවැම්බර් 20 දින ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා වෙත යවන ලදී.

1.2 මතය

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව වැලිගම ප්‍රාදේශීය සභාවේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත් මාගේ වාර්තාවේ දක්වා ඇති කරුණුවලින් මූල්‍ය ප්‍රකාශන වලට වන බලපෑම හැර 2012 දෙසැම්බර් 31 දිනට වැලිගම ප්‍රාදේශීය සභාවේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵල හා මුදල් ප්‍රවාහ ප්‍රකාශ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) 2012 ඔක්තෝබර් මස 28 දින මධ්‍යම පරිසර අධිකාරියෙන් පරිත්‍යාග ලෙස ලද රු.1,100,000 ක් වටිනා ට්‍රැක්ටරය සමාලෝචිත වර්ෂයේදී මෝටර් වාහන හා කරත්ත යටතේ ගිණුම් ගත නොකිරීම හේතුවෙන් ස්ථාවර වත්කම් එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) 2011 වර්ෂයේදී ණයගැති ප්‍රතිපාදනය රු.5,095,718 ක් වූ අතර එම ප්‍රතිපාදන මුදල සමාලෝචිත වර්ෂයේදී සභාවට ලැබී තිබූ අතර එය ගිණුම් ගත කිරීමේදී ණයගැති ගිණුම බැර කරනු වෙනුවට ආදායමක් ලෙසට බැර කිරීම නිසා වර්ෂය තුල ණය ගැති ශේෂය රු.5,095,718 කින් වැඩියෙන් දක්වා තිබුණි.

1.3.2 නොසැසඳූ පාලන ගිණුම්

පාලන ගිණුම අනුව ගිණුම් විෂයයන් 11 කට අදාල ශේෂයන්ගේ වටිනාකම රු.57,497,630 ක් වූ අතර උපයෝගී ලේඛණ අනුව එම ගිණුම් ශේෂයන්ගේ වටිනාකම රු.44,438,000 ක් වූයෙන් රු.13,059,630 ක වෙනසක් නිරීක්ෂණය විය.

1.3.3 අවිනිශ්චිත ගිණුම්

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන අවිනිශචිත ගිණුමේ රු.161,359 ක බැර ශේෂය නිරවුල් කර නොතිබුණි.

1.3.4 විගණනය සඳහා සාක්ෂි නොවීම

අවශ්‍ය තොරතුරු නොමැති වීම නිසා ගිණුම්වල ඇතුළත් රු.157,330,090 ක් වූ ගනුදෙනු විගණනයේදී සතුටුදායක ලෙස සංනිරීක්ෂණය කිරීමට නොහැකි විය.

2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.50,909,519 ක් වූ අතර, එයට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.6,695,759 ක් විය.

2.2 ආදායම් පරිපාලනය

2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් සමලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|---|
| | | රු.'000 | රු.'000 | රු.'000 |
| (i) | වරිපනම් බදු | 804 | 744 | 1,069 |
| (ii) | බදු කුලී | 287 | 2,922 | 605 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 1,965 | 2,399 | 387 |
| (iv) | වෙනත් ආදායම් | 18,905 | 20,164 | 45,749 |

2.2.2 හිඟ බදු

---------

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව අයවිය යුතු රු.1,065,910 ක බදු 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158 හා 159 වගන්තිවල විධිවිධාන අනුව අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

2.2.3 හිඟ වරිපනම් පිළිබඳ දේපල තහනම් කිරීමේ ක්‍රියාවලිය

----------------------------------------------------------

සමාලෝචිත වර්ෂය අවසානයට හිඟ වරිපනම් බදු ශේෂය රු.1,065,910 ක් විය. මෙම හිඟයෙන් 2012 දෙසැම්බර් 31 දිනට කඹුරුගමුව හා මිරිස්ස බල ප්‍රදේශයේ දේපල 2079 කට අදාලව රු.585,655 ක්ද වූයෙන් එම මුදල අයකර ගැනීමට දේපල තහනම් කිරීමේ නිලධාරීන් තිදෙනෙකු යොදවා තිබුණද 2012 දෙසැම්බර් 31 දින වන විටත් අයකර ගෙන තිබුනේ එම මුදලින් රු.172,810 ක් පමණි.

2.3 අවිධිමත් ගණුදෙනු

------------------------

(අ) 2013 අප්‍රේල් 22 දින අංක 1807/02 දරන ගැසට් නිවේදනය මගින් පලකරන ලද රීති පද්ධතයට අනුව මහජන නියෝජිත වශයෙන් තමාට පැවරී ඇති කාර්යයන් සඳහා පමණක් දීමනාව ලබාගත යුතු වුවද එලෙස කිසිදු කාර්ය පැවරීමකින් තොරව සමාලෝචිත වර්ෂයේදී රු.660,000 ක මුදලක් සභා අරමුදලින් මන්ත්‍රීවරුන්ට ගෙවා තිබුණි.

(ආ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 132 (ඒ) වගන්තිය ප්‍රකාරව උත්සව වියදම් සඳහා අදාල අමාත්‍යවරයාගේ පූර්ව අනුඥාව ලබා නොගෙන සමාලෝචිත වර්ෂයේ උත්සව වියදම් සඳහා රු.96,310 ක මුදලක් වැයකර තිබුණි.

2.4 කොන්ත්‍රාත් පරිපාලනය

-------------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) 2010/2011 පළාත් නිශ්චිත ප්‍රදාන යටතේ කඹුරුගමුව එපිටමුල්ල ජනදාස මාවත කොන්ක්‍රීට් කිරීම සඳහා රු.600,000 ක් වටිනා ගිවිසුමකට 2010 අගෝස්තු 18 දින ගොවි සංවිධානයක් සමඟ ගිවිසුමක් අත්සන් කර 2010 දෙසැම්බර් 01 දින කල වැඩ වාර්තාව අනුව රු.585,679 ක මුදලක් ගෙවා තිබුණ අතර 2013 අගෝස්තු 26 වන විට මාර්ගයේ කොන්ක්‍රීට් සම්පූර්ණයෙන්ම ගැලවී ගොස් තිබුණෙන් දරන ලද මුළු වියදම නිශ්ඵල වී තිබුණි.

(ආ) කඹුරුගමුව එපිටමුල්ල මාර්ගය කොන්ක්‍රීට් කිරීම සඳහා 2010 විමධ්‍යගත අයවැය යටතේ 2010 නොවැම්බර් 30 දින රු.786,679 ක් වටිනාකමට ග්‍රාම සංවර්ධන සමිතියක් සමඟ ගිවිසුමක් අත්සන් කර 2011 ජනවාරි 05 දිනැති කල වැඩ වාර්තාව මගින් රු.780,831 ක මුදලක් ගෙවා තිබුණි. 2013

---

අගෝස්තු 26 කරන ලද භෞතික පරීක්ෂණයේදී මෙම මාර්ගයේ කොන්ක්‍රීට් ස්ථරය සම්පූර්ණයෙන් ගැලවී ගොස් තිබූ බැවින් දරන ලද වියදම නිෂ්ඵල වී තිබුණි.

2.5 නිදංගල ආදාහනාගාරය ඉදිකිරීම

---

සභාපතිවරයාගේ ඉල්ලීම පරිදි නිදංගල ආදාහනාගාරයක් ඉදිකිරීම සඳහා පුද්ගලික ආයතනයක් විසින් රු.7,380,000 ක මුදලක් ප්‍රාදේශීය සභාව වෙත 2007 වර්ෂයේදි ලබා දී තිබුණි.

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) ආදාහනාගාරය ඉදිකිරීම සඳහා ප්‍රසම්පාදන ක්‍රම වේදයන් අනුගමනය කර නොතිබූ අතර සභා අනුමැතියකින් තොරව සභාපති විසින් කොන්ත්‍රාත්කරුවෙකු තෝරාගෙන ඉදිකිරීම් කාර්යය පවරා දී තිබුණි.

(ආ) කොන්ත්‍රාත්තුවේ ඇස්තමේන්තු ගත වටිනාකම වූ රු.5,777,482 කට සභාව 2007 අප්‍රේල් 05 දින කොන්ත්‍රාත්කරු සමග ගිවිසුම් අත්සන් කර තිබුණි. පළාත් පාලන කොමසාරිස්වරයා විසින් රු.2,500,000 ක මුදලක් කොන්ත්‍රාත්කරුට ගෙවා තිබුණි.

(ඇ) කොන්ත්‍රාත්කරු විසින් මෙම ඉදිකිරීම නිසි පරිදි නිම නොකර අත්හැර දැමීම නිසා 2009 අප්‍රේල් 05 දින සිට මෙම ගිවිසුම අවලංගු කළ අතර ලංසු සුරක්ෂණයේ වලංගු කාලය 2008 අප්‍රේල් 03 දින අවසන්ව තිබූ බැවින් සභාවට සිදුවූ පාඩුව ආපසු අයකර ගැනීමට කිසිදු පියවරක් ගෙන නොතිබුණි.

(ඈ) සභාපතිවරයාගේ ඉල්ලීම පරිදි ඉතිරි මුදල වූ රු.4,360,000 ක මුදල නැවත පළාත් පාලන කොමසාරිස්ගෙන් සභාවට එවා තිබූ අතර එම මුදල ආදාහනාගාරයේ කටයුතු වලට නොයොදා සභාවේ පුනරාවර්තන වියදම් සඳහා වැයකර ගෙන තිබුණි.

(ඉ) 2013 අගෝස්තු 30 දිනැති ස්ථානීය පරීක්ෂණ අවස්ථාව වන විට ආදාහනාගාරයේ විමිනිය සම්පූර්ණයෙන් කඩා වැටී අක්‍රිය වී තිබුණි.

2.6 මෙහෙයුම් අකාර්යක්ෂමතා

---

විදුලි බල හා බලශක්ති අමාත්‍යාංශ ලේකම්ගේ පළාත් පාලන ආයතන බල ප්‍රදේශ තුල වීථි පහන් ආලෝකකරණය සම්බන්ධයෙන් වූ අංක පීඊ/01/01/2010 දරන චක්‍රලේඛයේ 02 ඡේදය පරිදි බල ප්‍රදේශයේ වීථි පහන් නඩත්තු කිරීම වෙනුවෙන් වියදම් වන මුදල් ප්‍රතිපූර්ණය කර ගැනීම සඳහා ඉල්ලුම් කළයුතු වුවද සමාලෝචිත වර්ෂයට අදාල රු.1,344,524 ක් වූ නඩත්තු වියදම ප්‍රතිපූර්නය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

2.7 අභ්‍යන්තර විගණනය

ආයතනය තුල ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණන හා කළමනාකරණ කමිටු පිහිටුවා නොතිබුණි.

3. පද්ධති හා පාලන

පහත දැක්වෙන පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ සභාපතිවරයාගේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය
(ආ) මූල්‍ය පාලනය
(ඇ) ආදායම් පරිපාලනය
(ඇ) වත්කම් කළමනාකරණය